**ලෝක ළමා දින සැමරුම - 2021**

**කාන්තා හා ළමා සංවර්ධන,පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටතල පහසුකම් හා අධ්‍යාපනසේවා රාජ්‍ය අමාත්‍යාංශය**

**පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව**

**කියන්න බැරි දේ අඳින්න - ළමා චිත්‍ර තරඟාවලිය**

**1. හැඳින්වීම:**

ආදි මානවයා සිය විවිධ වූ අභිමතාර්ථයන් සපුරාගැනීම අරබයා ප්‍රබල ප්‍රකාශන මාධ්‍යක් ලෙස චිත්‍රය භාවිතයට ගත් අතර එදා සිට මේ දක්වා සමස්ත මානව ප්‍රජාවගේ අභිවෘද්ධිය සඳහා චිත්‍රය විසින් කරනු ලැබූ පුළුල් මෙහෙවර සුවිශේෂී වේ. මෙම සුවිශේෂී බව තවදුරටත් අර්ථවත් කරනු පිණිස ලෝක ළමා දින ජාතික සැමරුමට සමගාමීව කුසලතා සපිරි නිර්මාණශීලි අනාගත පරපුරක් වෙනුවෙන් මෙම චිත්‍ර තරඟය සංවිධානය කරනු ලබයි. චිත්‍ර කලාව දරුවන්ගේ පෞරුෂ සංවර්ධනය උදෙසා පුළුල් වූ මෙහෙවරක් ඉටු කරනු ලබන බවත් විශේෂයෙන් ළමා චිත්‍රය දරුවන්ගේ සැඟවුණු කුසලතාවයන් ඉස්මතු කරගැනීමට මහත්සේ ඉවහල්වන බවත් ලෝකයේ ප්‍රකට අධ්‍යාපනඥයින් සහ මනෝ වෛද්‍යවරුන් විසින් පිළිගෙන ඇත. පවත්නා කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ දරුවන්ගේ යහපත් මානසික සෞඛ්‍ය රැකගැනීම සඳහා ද මෙම චිත්‍ර තරඟය මනා පිටුවහලක් වනු ඇත.

2. අරමුණු:

- දරුවන්ගේ කලා කුසලතා වර්ධනය කර ගැනීමට හා ප්‍රදර්ශනය කිරීමට ඉඩ ප්‍රස්ථා ලබාදීම
- දරුවන්ගේ නිර්මාණශීලි පෞරුෂය පෝෂණය කිරීම
- දරුවන් තුළ හා සමස්ත සමාජය තුළ වින්දනාත්මක ශක්තීන් වැඩි දියුණු කිරීම
- දරුවන් තුළ ස්වයං අභිමාණයක් ගොඩ නැගීම
- ඔවුනොවුන් අතර සහජීවනය වර්ධනය කරවීම
- ආත්මීය ප්‍රකාශනයන්ට අවස්ථාව සළසාදීම
- දරුවන්ගේ විවිධ අවශ්‍යතාවයන්,අපේක්ෂාවන් හා අභිමතාර්ථයන් අවබෝධ කර ගැනීම

**3. ඉලක්ක කණ්ඩායම:**

රජයේ පාසැල්වල අධ්‍යාපනය ලබන දරුවන් හා අධ්‍යාපන අමාත්‍යාංශය අනුමත පෞද්ගලික පාසල් හා සියළු පිරිවෙන් විද්‍යායතනවල අධ්‍යාපනය ලබන දරු දැරියන් හා ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට මෙන්ම ළමා නිවාස හා ළමා සංවර්ධන මධ්‍යස්ථානවල දරුවන්ට ද මෙම චිත්‍ර තරගය සඳහා ඉදිරිපත්වීමට සුදුසුකම් ලබයි.

**4. තරඟය පවත්න ආකාරය:**

මෙම පාසල් ළමා චිත්‍ර තරඟය අංශ 05ක් යටතේ සංවිධානය කරනු ලබයි. එනම්

i. ප්‍රාථමික අංශය : වයස අවුරුදු 05 – 06
ii. පශ්චාත් ප්‍රාථමික අංශය: වයස අවුරුදු 07 – 09
iii. කණිෂ්ඨ අංශය: වයස අවුරුදු 10 – 12
iv. ජොෂ්ඨ අංශය: වයස අවුරුදු 13 -15
v. ජොෂ්ඨ ද්විතියක අංශය: වයස අවුරුදු 16 -18

- ඉහත වයස් කාණ්ඩ අනුව දරුවන්ට මෙම තරඟය සඳහා ඉදිරිපත්විය හැකිය. 2021.10.01 දිනට අදාළ වයස් සීමාවන් සළකා බලනු ලැබේ. ඉහත සෑම තරග අංශයක් සඳහාම පහත සඳහන් පරිදි සම්මාන සහතික පත්‍ර හා මුදල් ත්‍යාග පරිනැමීමට කටයුතු කරනු ලැබේ. එනම්

- ප්‍රථම ස්ථානය
- දෙවන ස්ථානය
- තුන්වන ස්ථානය
- විශිෂ්ට සම්මාන
- කුසලතා සම්මාන
- විශේෂ සහතික

5. **තරඟය සඳහා චිත්‍ර ඉදිරිපත් කිරීම:**
   ඉහත වයස් කාණ්ඩවල පසුවන දරුවන් මේ සමග අමුණා ඇති ආදර්ශ අයදුම් පත්‍රය හා තමාගේ චිත්‍ර නිර්මාණය 2021 ජුලි මස 25 දිනට පෙර ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනවිත් පහත ලිපිනයට භාරදිය හැකිය.

   **<u>කොමසාරිස්</u>**
   **<u>පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව</u>**
   **<u>ii අදියර 3 වන මහල</u>**
   **<u>සෙත්සිරිපාය - බත්තරමුල්ල</u>**

නිර්මාණ එවන කවරයේ වම්පස ඉහල කෙලවර **"ලෝක ළමාදින ළමා චිත්‍ර තරඟාවලිය - 2021"** යනුවෙන් සඳහන් කළ යුතුවේ.

6. **නිර්මාණ තේරීම:**
   2021 ජුලි 25 දිනට ලැබෙන නිර්මාණ සියල්ල අදාල අංශ යටතේ වර්ග කර ක්ෂේත්‍රයේ පළපුරුදු විනිශ්චය මණ්ඩලයක් මගින් තෝරාගනු ලබන අතර එක් දිස්ත්‍රික්කයකින් එක් අංශයක් යටතේ නිර්මාණ 100ක් මූලික වටය සඳහා තෝරා ගැනීමට අපෙක්ෂිතය .

7. **අවසන් තරඟය පැවැත්වීම:**
   මූලික වටයේ තෝරා ගන්නා ලද චිත්‍ර ඉදිරිපත් කරන ලද දරුවන්ට තමන් ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය තුළ තෝරා ගන්නා ලද ස්ථානයකදී දැනුම් දෙනු ලබන දිනයකදී විනිශ්චය මණ්ඩලයක් ඉදිරියේ අදාළ චිත්‍රය නැවත ඇදීමට අවස්ථාව ලබාදෙනු ඇත .ඒ සඳහා සෑම අංශයක් සඳහාම කාලය පැය 03 කි. එම චිත්‍ර ඒ අවස්ථාවේදිම ඇගයීමට ලක්කර සෑම අංශයකින්ම ප්‍රථම ස්ථානය ලබා ගන්නා නිර්මාණ අවසන් මහා තරගය සඳහා අදාළ කරගනු ලබයි.

   ඊට අමතරව සෑම අංශයකින්ම 5 වන ස්ථානය දක්වා ජයග්‍රහණය කරනු ලබන දරුවන්ට කුශලතා සහතිකයක් පිරිනැමීමට කටයුතු කරනු ලබන අතර අදාළ සහතිකය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ලබාදීමට කටයුතු සළස්වනු ඇත.

8. **ජාතික තරඟය ( අවසාන තරගය) :**
   දිස්ත්‍රික් මට්ටමින් ප්‍රථම ස්ථානය ලබා ගන්නා ලද නිර්මාණ අදාළ කර ගනිමින් කොළඹ දි ක්ෂේත්‍රයේ පළපුරුදු විනිශ්චය මණ්ඩලයක් මගින් ජයග්‍රාහකයන් තේරීමට කටයුතු කරනු ලබයි. සෑම අංශයකින්ම 1,2 හා 3 වන ස්ථාන හිමිකර ගන්නා ජයග්‍රාහකයන්ට ලෝක ළමා දින ජාතික සැමරුම් උත්සව අවස්ථාවේදී ත්‍යාග හා සහතික පත්‍රයක් පිරිනැමීමට කටයුතු කරනු ලැබේ.

   ඊට අමතරව ජයග්‍රාහක නිර්මාණ අදාළ කර ගනිමින් ලෝක ළමා දින ජාතික සැමරුම් උත්සවයට සමගාමීව චිත්‍ර ප්‍රදර්ශනයක් පැවැත්වීමට ද අපේක්ෂිතය.

9. තරඟ තේමාව:
පළමු වටයේදී ඔබ කැමති ඕනෑම තේමාවක් යටතේ /මාතෘකාවක් යටතේ නිර්මාණ ඉදිරිපත් කළ හැකිය.

10. තරඟ කොන්දේසි:
**සෑම අංශයක් හා සෑම අදියරක් සඳහාම මෙම තරග කොන්දේසි අදාළ කරගනු ලබයි.**

- ඔබ කැමති ඕනෑම වර්ණ මාධ්‍යයක් චිත්‍ර ඇඳීම සඳහා භාවිතා කළ හැකිය
- මෙම තරය සඳහා ඉදිරිපත් කල හැක්කේ ප්‍රකාශන චිත්‍ර පමණකි.
- ඉදිරිපත් කරනු ලබන චිත්‍රයේ ප්‍රමාණය අගල් 18 x14 විය යුතුවේ.
- එක් අයකුට ඉදිරිපත් කල හැක්කේ එක් නිර්මාණයක් පමණි.
- ඉදිරිපත් කරනු ලබන නිර්මාණය තමන්ගේම බවට අදාළ දරුවා විසින්ම සහතික කළ යුතුවේ.
- ඉදිරිපත් කරනු ලබන නිර්මාණ මීට පෙර තරගයකට ඉදිරිපත් කරන ලද නිර්මාණයක් නොවිය යුතුය.
- නිවැරදිව හා පැහැදිළිව සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය චිත්‍රයේ පිටුපස නොගැලවෙන සේ ඇලවීම හෝ අදාළ තොරතුරු පසුපිටේ ලියා දැක්විය හැකිය.
- තරග කොනදේශි සම්පූර්ණ කර නොමැති නිර්මාණ හා ඉල්ලා ඇති තොරතුරු නිවැරදිව සඳහන් නොකරන ලද නිර්මාණ තරඟයෙන් ඉවත් කරනු ඇත.
- ඔබ විසින් එවනු ලබන නිර්මාණ ප්‍රවීන විනිශ්චය මණ්ඩලයක් වෙත ඉදිරිපත් කර ඔවුන්ගේ නිර්දේශ මත තෝරා ගන්නා ළමුන් පමණක් අදාළ දිස්ත්‍රික් තරඟය සඳහා තෝරා ගනු ලැබේ.
- දිස්ත්‍රික් තරඟය සඳහා ඉදිරිපත්විය හැක්කේ නිර්මාණ එවා දිස්ත්‍රික් තරඟයට තෝරාගත් බවට පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්ගේ ලිඛිත දැනුම්දීමක් ඇති දරුවන්ට පමණි.
- දිස්ත්‍රික් තරඟ පැවැත්වෙන වේලාව ස්ථානය සහ දිනය පසුව දැනුම් දෙනු ලැබේ.
- විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

**සැ:යු: රටතුළ පවතින වර්තමාන තත්ත්වයන් අනුව අවසාන තරග පැවැත්වීමේදී යම් යම් වෙනස්කම් සිදුවිය හැකිය.**


මේ පිළිබඳ වැඩි විස්තර සඳහා:
ඒ.එල් කිත්සිරි -ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී
011 -2186062/0714392846/ 0769905750

සුධිර නිලංග විතාන
කොමසාරිස් (වැඩ ආවරණ)
පරිවාස හා ළමාරක්ෂක සේවා

ලෝක ළමාදින සැමරුම -2021 කාන්තා හා ළමා සංවර්ධන,පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන,පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය
පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
ළමා චිත්‍ර තරඟාවලිය -

**ආදර්ශ අයදුම් පත්‍රය**

1. නිර්මාණය ඉදිරිපත් කරන දරුවාගේ නම: ..........................................................................
2. උපන් දිනය: ..........................................................................
3. 2021.10.01 දිනට වයස:..........................................................................
4. මව/පිය/භාරකරුගේ නම:..........................................................................
5. ලිපිනය :..........................................................................
6. දුරකථන අංකය: ..........................................................................
7. විද්‍යුත් ලිපිනය :..........................................................................
8. දිස්ත්‍රික්කය : ..........................................................................
9. ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය..........................................................................
10. චිත්‍රයේ තේමාව/ මාතෘකාව: ..........................................................................

ඉහත සඳහන් තොරතුරු සත්‍යය හා නිවැරදි බවත්, ඉදිරිපත් කර ඇති නිර්මාණය මාගේ නිර්මාණයක් බවත් තරඟයේ නීතිරීති පිළිපැදීමට බැඳි සිටින බවත් ප්‍රකාශ කරමි.

අත්සන: ..........................................................

නම: ..........................................................................

දිනය: